විශ්‍රාම වැටුප් චක්‍රලේඛ: **02/2025**

මගේ අංකය: Pen/Pol/06/05-2025
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
මාලිගාවත්ත
කොළඹ 10.
2025.07. 01

දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

**2025 අයවැය යෝජනා අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන II හි 2018.01.01, 2019.01.01 සහ 2020.01.01 දිනට හිමිවිය යුතු වැටුප මත විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනය කිරීම**

2025 අයවැය යෝජනා මගින් ප්‍රකාශිත පරිදි රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන II හි සඳහන් 2018.01.01, 2019.01.01 සහ 2020.01.01 දිනට හිමිවිය යුතු වැටුප මත විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනය සිදු කළ යුතු ආකාරය පිළිබඳ විධිවිධාන ඇතුළත් කරමින් 2025.07.01 දිනැතිව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/2025 නිකුත් කර ඇත.

02. ඉහත චක්‍රලේඛ විධිවිධාන අනුව විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනය කිරීම අදියර 03ක් යටතේ සිදු කළ යුතු ය. ඉන් පළමු අදියර යටතේ 2018.01.01 දින හෝ ඊට පෙර විශ්‍රාම ලද සියලුම රාජ්‍ය නිලධරයන්ගේ සහ ත්‍රිවිධ සන්නද්ධ හමුදා සේවා පුද්ගලයින්ගේ විශ්‍රාම වැටුප රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන II හි සඳහන් 2018.01.01 දිනට හිමිවිය යුතු වැටුප මත ප්‍රතිශෝධනය කිරීම සිදු කළ යුතු අතර, එය 2025.07.01 දින සිට ක්‍රියාත්මක කළ යුතු ය.

03. 2025.07.01 දින සිට ක්‍රියාත්මක කිරීමට නියමිත පළමු අදියරේ දි පහතින් සඳහන් කර ඇති කාණ්ඩවලට අයත් විශ්‍රාමිකයින්ගේ / මියගිය විශ්‍රාමිකයින් වෙනුවෙන් වැන්දඹු, වැන්දඹු පුරුෂ, අනත්දරු හා ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප් ලබමින් සිටින ප්‍රතිලාභීන්ගේ විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනය කිරීම සිදු කරනු ලැබේ.

03.1. 2018.01.01 දින හෝ ඊට පෙර විශ්‍රාම ගොස් 2025.07.01 දින වන විට විශ්‍රාම වැටුප් ලබමින් සිටින විශ්‍රාමික නිලධරයන්

03.2. සේවයේ යෙදී සිටිය දී 2018.01.01 දින හෝ ඊට පෙර මියගොස් ඇති නිලධරයන් වෙනුවෙන් 2025.07.01 දින වන විට වැන්දඹු, වැන්දඹු පුරුෂ, අනත්දරු හා ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප් ලබමින් සිටින ප්‍රතිලාභීන්

03.3. 2018.01.01 දින හෝ ඊට පෙර විශ්‍රාම ගොස් විශ්‍රාම වැටුප් ලබා ගැනීමෙන් පසුව මියගිය විශ්‍රාමික නිලධරයන් වෙනුවෙන් 2025.07.01 දින වන විට වැන්දඹු, වැන්දඹු පුරුෂ, අනත්දරු හා ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප් ලබමින් සිටින ප්‍රතිලාභීන්

04. 2025.07.01 දින සිට විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනයට අදාළ පළමු අදියර ක්‍රියාත්මක කළ යුතු ආකාරය පිළිබඳව උපදෙස් ඇතුළත් කරමින් මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන අතර එහි දී 2017.01.01 දින හෝ ඊට පෙර විශ්‍රාම ලද සියලු රාජ්‍ය නිලධරයන්ගේ සහ ත්‍රිවිධ සන්නද්ධ සේවා නිලධරයන්ගේ විශ්‍රාම වැටුප්, විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 01/2019 සහ එහි සංශෝධන අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන II හි සඳහන් 2017.01.01 දිනට හිමිවිය යුතු වැටුප මත ප්‍රතිශෝධනය කර ඇත යන්න උපකල්පනය කෙරේ.

05. ඉහත 01 ඡේදයේ සඳහන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/2025 හි විධිවිධාන අනුව පළමු අදියරට අදාළව විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනය කිරීම සඳහා පහතින් සඳහන් කර ඇති උපදෙස් පරිදි කටයුතු කළ යුතු ය.

05.1. ඒ ඒ විශ්‍රාමික නිලධරයාගේ නමින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පවත්වාගෙන යනු ලබන විශ්‍රාම වැටුප් ලිපි ගොනුව අනුසාරයෙන් මෙම විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය සිදු කළ යුතු ය.

05.2. ප්‍රතිශෝධන කටයුතු සිදු කිරීමට ප්‍රථමයෙන් ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුළ පවතින විශ්‍රාම වැටුප් ලිපිගොනු අතරින් 2018.01.01 දින හෝ ඊට පෙර විශ්‍රාම ගොස් විශ්‍රාම වැටුප් ලබමින් සිටින විශ්‍රාමික නිලධරයන්ගේ විශ්‍රාම වැටුප් ගොනු සහ 2018.01.01 දින හෝ ඊට පෙර සේවයේ යෙදී සිටිය දී හෝ විශ්‍රාම ගොස් සිටිය දී මියගිය නිලධරයන් වෙනුවෙන් වැන්දඹු, වැන්දඹු පුරුෂ, අනත්දරු හා ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප් ලබමින් සිටින ප්‍රතිලාභීන්ට අදාළ ගොනු තෝරා වෙන් කර ගැනීම සිදු කළ යුතු ය.

05.3. ඉහත 5.2 ඡේදයේ සඳහන් පරිදි තෝරා ගනු ලබන ගොනු ප්‍රමාණය තුළ විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 01/2019 සහ එහි සංශෝධන පරිදි 2017.01.01 දිනට හිමිවිය යුතු වැටුප් මත පදනම් ව විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය නොකරන ලද ගොනු ඇතුළත් වී තිබේ ද යන්න පරීක්ෂා කිරීම ඉන් පසුව සිදු කළ යුතු ය. එවැනි ගොනු පවතී නම්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන II හි සඳහන් 2017.01.01 දිනට හිමි විය යුතු වැටුප මත පදනම්ව විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනය කිරීම මුලින් ම සිදු කළ යුතු ය.

05.4. 2025.07.01 දින සිට සිදු කළ යුතු විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනය සඳහා, විශ්‍රාම වැටුප් කළමනාකරණ දත්ත පද්ධතිය මගින්, හඳුන්වාදෙනු ලබන "2025 විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධන මොඩියුලය" (Pension Revision Module-2025) භාවිත කළ යුතු ය. ඒ සඳහා ඉහත 05.2 සහ 05.3 ඡේදවල සඳහන් කර ඇති පරිදි කටයුතු කිරීමෙන් පසුව දත්ත පද්ධතිය මගින් ප්‍රතිශෝධන කටයුතු කළ හැකි ගොනු ප්‍රමාණය සහ දත්ත පද්ධතිය මගින් ප්‍රතිශෝධනය සිදු කළ නොහැකි ගැටළු පවතින ගොනු ප්‍රමාණය වෙන් වෙන්ව තෝරා ගැනීම අවශ්‍ය වේ.

05.5. දත්ත පද්ධතිය මගින් ප්‍රතිශෝධනය සිදු කළ හැකි ගොනු තෝරා ගැනීමෙන් පසුව එම එක් එක් විශ්‍රාම වැටුප් ගොනුවට අදාළව දත්ත පද්ධතිය මගින් නිරූපනය කරනු ලබන පහත සඳහන් තොරතුරු විශ්‍රාම වැටුප් ලිපිගොනුවේ අදාළ තොරතුරු සමඟ සංසන්දනය කර පරීක්ෂා කර බලා එම තොරතුරුවල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතු ය. විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනයට අදාළ ගණනය

කිරීම දත්ත පද්ධතිය මගින් සිදු කරන බැවින් තොරතුරුවල නිරවද්‍යතාවය ඉහත පරිදි තහවුරු කර ගැනීම අත්‍යාවශ්‍ය වේ.

i. විශ්‍රාමික නිලධරයාගේ නම
ii. විශ්‍රාම වැටුප් අංකය
iii. ජාතික හැඳුනුම්පත් අංකය
iv. විශ්‍රාම ගන්වා ඇති දිනය
v. විශ්‍රාම ගන්වන ලද වගන්තිය
vi. විශ්‍රාම ගන්වන ලද අවස්ථාවේ සේවයේ යෙදී ඇති තනතුර, පන්තිය/ශ්‍රේණිය
vii. විශ්‍රාම වැටුප ගණනය කිරීම සඳහා අදාළ කර ගත් වැටුප් කේතය සහ වැටුප් පියවර
viii. දළ සේවා කාලය
ix. වැටුප් රහිත සේවා කාලය
x. ශුද්ධ සේවා කාලය
xi. නිලධරයාගේ ශුද්ධ සේවා කාලයට අදාළ ප්‍රතිශතය
xii. 2017.01.01 දිනට අදාළ වැටුප් පියවර
xiii. 2017.01.01 දිනට අදාළ ප්‍රතිශතය සහ අඩු කළ / අඩු නොකළ විශ්‍රාම වැටුප
xiv. 2018.01.01 දිනට අදාළ වැටුප් පියවර
xv. 2018.01.01 දිනට අදාළ ප්‍රතිශතය සහ අඩු කළ / අඩු නොකළ විශ්‍රාම වැටුප

05.6. විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය සඳහා භාවිත කළ යුතු රාජ්‍ය සේවයේ තනතුරු උපලේඛනය ඇමුණුම 01 වශයෙන් ද, එකී තනතුරු උපලේඛනයේ සඳහන් තනතුරු වලට අදාළ වැටුප් පරිවර්තන වගු ඇමුණුම 02 වශයෙන් ද, ත්‍රිවිධ සන්නද්ධ හමුදා සේවා වලට අදාළ තනතුරු උපලේඛනය සහ වැටුප් පරිවර්තන වගු ඇමුණුම 03 වශයෙන් ද 2025.07.01 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/2025 හි ඇතුළත් කර ඇත.

05.7. රාජ්‍ය සේවයේ විශ්‍රාමික නිලධරයන්ට අදාළව විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනය කිරීමේ දී 2016.04.27 දිනැතිව නිකුත් කර ඇති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 03/2016 හි ඇතුළත් 2018 වර්ෂයට අදාළ ප්‍රතිශත වගුව භාවිත කළ යුතු ය. (ඇමුණුම 01)

05.8. ත්‍රිවිධ සන්නද්ධ හමුදා සේවාවන්ට අයත් විශ්‍රාමික පුද්ගලයින්ගේ විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනය කිරීමේ දී ඇමුණුම 02 හි ඇතුළත් ප්‍රතිශත වගුව භාවිත කළ යුතු ය.

05.9. යම් කිසි විශ්‍රාමික නිලධරයෙකුට අදාළව විශ්‍රාම වැටුප් ලිපි ගොනුවක් නොමැති නම් විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 13/2001 හි ලබා දී ඇති උපදෙස් පරිදි කටයුතු කර තාවකාලික විශ්‍රාම වැටුප් ගොනුවක් සකස් කර ගත යුතු ය. (ඇමුණුම 03)

05.10. රාජ්‍ය සේවයේ සහ ත්‍රිවිධ සන්නද්ධ හමුදා සේවාවන්හි විශ්‍රාමික නිලධරයින් සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනයේ දි අදාළ කර ගත යුතු විශ්‍රාම වැටුප් වර්ග සංකේත අංක ඇමුණුම 04 හි ඇතුළත් කර ඇත.

05.11. විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය කිරීමේ දී විශ්‍රාමික නිලධරයාගේ සේවා කාලය පිළිබඳව තොරතුරු පරීක්ෂා කිරීමේ දී පහත කරුණු පිළිබඳව අවධානය යොමු කළ යුතු ය.

05.11.1. පහත 05.11.2 , 05.11.3 සහ 5.11.4 හි සඳහන් කර ඇති අවස්ථාවන්හි දී හැර අනිකුත් සෑම අවස්ථාවකදීම විශ්‍රාමික නිලධරයා සේවයේ යෙදී ඇති සත්‍ය සේවා කාලය මත පදනම්ව ප්‍රතිශෝධනය සිදු කළ යුතු ය.

05.11.2. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 හි විධිවිධාන යටතේ විශ්‍රාම ලබා ඇති නිලධරයන් සඳහා ඔවුන්ගේ සේවා කාලය මාස 300 (අවුරුදු 25) ක් සේ සලකා කටයුතු කළ යුතු ය.

05.11.3. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2 සහ 7 වගන්තිවල විධිවිධාන අනුව විශ්‍රාම ගෙන ඇති නිලධරයන්ගේ සේවා කාලය වන්නේ, එකී 2 සහ 7 වගන්ති යටතේ විශ්‍රාම ගෙන ඇති දිනට සම්පූර්ණ කර ඇති සේවා කාලයට තවත් මාස 60ක් එකතු කිරීමෙන් පසුව ලැබෙන සේවා කාලය වේ.

05.11.4. සේවයේ යෙදී සිටිය දී මිය ගිය නිලධරයන් වෙනුවෙන් වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ලබමින් සිටින ප්‍රතිලාභීන්ට අදාළව විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 07/2000 හි විධිවිධාන අනුව සේවා කාලය ගණනය කිරීම සිදු කළ යුතු ය. (ඇමුණුම 05)

05.11.5. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/88 සහ 30/88 (සංශෝධන I) හි විධිවිධාන අනුව විශ්‍රාම ගොස් ඇති විශ්‍රාමික නිලධරයන් විශ්‍රාම ගන්වන දිනට සත්‍ය ලෙසම රාජ්‍ය සේවයේ යෙදී ඇති කාල සීමාව සේවා කාලය ලෙස සැලකිය යුතු ය.

05.12. නිලධරයාගේ විශ්‍රාම ගැන්වීම ක්‍රියාත්මක වන දිනය පිළිබඳව තොරතුරු පරීක්ෂා කිරීමේ දී පහත කරුණු පිළිබඳව අවධානය යොමු කළ යුතු ය.

05.12.1. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/88 සහ 30/88 (I) හි විධිවධාන යටතේ විශ්‍රාම ගන්වා ඇති නිලධරයන්ට අදාළව විශ්‍රාම ගැන්වීම ක්‍රියාත්මක වූ දිනය වශයෙන් ඔවුන්ගේ වයස අවුරුදු 55 සම්පූර්ණ වන දිනය පිළිබඳව තොරතුරු ඇතුළත් කළ යුතු ය.

05.13. පහතින් සඳහන් කරනු ලබන විශ්‍රාමික නිලධරයන් මෙම චක්‍රලේඛයේ විධිවිධාන අනුව විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය සඳහා හිමිකම් නොලබයි.

05.13.1. ත්‍රිවිධ සන්නද්ධ හමුදා සේවාවන්හි, පොලිසිය සහ විශේෂ කාර්ය බලකායේ සේවයේ යෙදී විශ්‍රාම ලැබීමෙන් පසුව වයස අවුරුදු 55 දක්වා වැටුප් සහ දීමනා ලබන විශ්‍රාමික නිලධරයන්, මියගිය නිලධරයන්ගේ වැන්දඹුවන් සහ වැන්දඹු පුරුෂයන්

05.13.2. ත්‍රිවිධ සන්නද්ධ හමුදා සේවාවන් හි සේවයේ යෙදී විශ්‍රාම ලබා ගැනීමෙන් පසුව සේවා මුක්ත භට පදනම මත නැවත රජයේ සේවයේ තනතුරුවල සේවයේ යෙදෙමින් වැටුප් සහ දීමනා ලබන නිලධරයන්

05.13.3 විශ්‍රාම වැටුප් අහිමි තත්ත්වයෙන් සේවය අවසන් කර ඇති විශ්‍රාමිකයින් වෙනුවෙන් විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 13/2010 හි විධිවිධාන අනුව වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ලබන ප්‍රතිලාභීන්

05.13.4 විශ්‍රාම වැටුප් වර්ග සංකේත අංක 04,05,06,07,12,42,56,57,58,59,75 සහ 77 යටතේ ප්‍රතිලාභ ලබන ප්‍රතිලාභීන් (ඇමුණුම 06)

05.14. ඉහත 05.13.1 හි සඳහන් වයස අවුරුදු 55 දක්වා වැටුප් සහ දීමනා ලබන අය අතරින් 2018.01.01 දින හෝ එදිනට පෙර වයස අවුරුදු 55 සම්පූර්ණ කර ඇති විශ්‍රාමික නිලධරයන්ට සහ මියගිය නිලධරයන් ගේ වැන්දඹුවන් සහ වැන්දඹු පුරුෂයන්ට අදාළව මෙම චක්‍රලේඛ විධිවිධාන යටතේ විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය සිදු කළ යුතු ය.

05.15. විශ්‍රාමික නිලධරයා සේවයෙන් විශ්‍රාම ගැන්වූ අවස්ථාවේ හෝ සේවයේ යෙදී සිටිය දී මියගිය අවස්ථාවේ නිලධරයා වෙත හිමිගන්වනු ලැබූ නිවැරදි වැටුප් පියවර දත්ත පද්ධතියේ ඇතුළත් වී තිබේදැයි පරීක්ෂා කළ යුතු ය. විශ්‍රාම වැටුප් සහිත දීමනා සහ උපයාගත් වැටුප් වර්ධක අගය එකතු කර විශ්‍රාම වැටුප ගණනය කර ඇති අවස්ථාවක දී එම දීමනා සහ උපයාගත් වැටුප් වර්ධක අගය අඩුකර නිවැරදි වැටුප් පියවර ලබා ගත යුතු ය.

05.16. විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනය කිරීමේ ක්‍රමවේදය

05.16.1. විශ්‍රාමික සිවිල් නිලධරයන්ට අදාළව විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනය කිරීම.

i. නිලධරයා විශ්‍රාම ලැබූ අවස්ථාවේ දී දැරූ තනතුර සහ විශ්‍රාම වැටුප ගණනය කිරීමට පාදක කර ගත් වැටුප් කේතය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/2025 හි ඇමුණුම 01 හි ඇතුළත් තනතුරු උපලේඛනය අනුව හඳුනාගත යුතු ය.

ii. ඉන්පසුව එම තනතුරට අදාළ පරිවර්තන වගුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/2025 හි ඇමුණුම 02 හි ඇතුළත් පරිවර්තන වගු අතරින් තෝරාගත යුතු ය. (උපලේඛනයේ සඳහන් නොවන තනතුරු සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව මෙම දෙපාර්තමේන්තුව වෙතින් විමසා උපදෙස් ලබා ගැනීම සිදු කළ යුතු ය.)

iii. විශ්‍රාම වැටුප ගණනය කිරීම සඳහා පාදක කර ගත් වැටුප් පියවර පදනම් කරගෙන පරිවර්තන වගුවේ 2018.01.01 දිනට සඳහන් කර ඇති අනුරූපී වැටුප් පියවර කුමක් ද යන්න තහවුරු කර ගත යුතු ය.

iv. විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය සඳහා ඇමුණුම 01හි ඇතුළත් ප්‍රතිශත වගුව භාවිත කළ යුතු ය.

v. ඉහත 05.5 ඡේදය යටතේ සඳහන් කර ඇති තොරතුරු සමඟ 2018.01.01 දිනට අනුරූපී වැටුප් පියවර සහ ඊට අදාළ විශ්‍රාම වැටුප් ප්‍රතිශතය, ඒ අනුව ගණනය කරන අඩු කළ සහ අඩු නොකළ වැටුප, 2025.07.01 දිනට ගෙවීම් කළ යුතු වැටුප යන තොරතුරු නිවැරදි ද යන්න පරීක්ෂා කිරීම සිදු කළ යුතු ය.

vi. ඉහත 05.16.1 (v) අනුව දත්ත පද්ධතිය මගින් නිරූපනය කරන තොරතුරු විශ්‍රාම වැටුප් ලිපිගොනුවල ඇතුළත් තොරතුරු සමඟ සංසන්දනය කර නිරවද්‍යතාවය තහවුරු කිරීම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සේවයේ නියුතු විශ්‍රාම වැටුප් නිලධරයින් විසින් සිදු කළ යුතු අතර විශ්‍රාම වැටුප් නිලධරයින් නොමැති කාර්යාල වල එම කටයුත්ත සම්බන්ධයෙන් වගකීම පැවරෙන නිලධරයන් විසින් එය සිදු කළ යුතු ය. ඉහත පරිදි දත්ත පරීක්ෂා කර තහවුරු කිරීමෙන් පසුව එම දත්ත නිර්දේශ කිරීම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරි විසින් ද අනුමත කිරීම අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් ද සිදු කළ යුතු ය. ඉන්පසුව පද්ධතිය මගින් ජනනය වන source document හි සකස් කිරීම, පරීක්ෂා කිරීම, නිර්දේශය සහ අනුමැතිය සම්බන්ධයෙන් අදාළ නිලධරයින්ගේ අත්සන් යොදා විශ්‍රාම වැටුප් ගොනුවට ඇතුළත් කිරීම සිදු කළ යුතු ය.

vii. ඉහත තොරතුරු අනුව විශ්‍රාමික නිලධරයාගේ සේවා කාලයට නියමිත ප්‍රතිශතය මත ප්‍රතිශෝධිත විශ්‍රාම වැටුප ගණනය කිරීම දත්ත පද්ධතිය මගින් සිදු කරනු ලැබේ. ඉහත පරිදි ගණනය කරන අඩු කළ / අඩු නොකළ විශ්‍රාම වැටුප ප්‍රතිශෝධිත විශ්‍රාම වැටුප වන අතර ඊට අදාළව විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය සංශෝධනය නොවේ.

viii. මියගිය විශ්‍රාමික සිවිල් නිලධරයන් වෙනුවෙන් වැන්දඹු, වැන්දඹු පුරුෂ, අනත්දරු හා ආබාධිත විශ්‍රාම වැටුප් ලබමින් සිටින ප්‍රතිලාභීන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය කිරීමේ දී විශ්‍රාමික සිවිල් නිලධරයාට අදාළව දත්ත පද්ධතිය මගින් නිරූපනය කරනු ලබන තොරතුරුවල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමෙන් පසුව ඉහත 05.16.1 යටතේ සඳහන් කර ඇති පරිදි ප්‍රතිශෝධිත විශ්‍රාම වැටුප සකස් කිරීමට අදාළ කටයුතු සිදු කළ යුතු ය.

ix. විශ්‍රාම වැටුප සමඟ මේ දක්වා ගෙවීම් කර ඇති ජීවන වියදම් දීමනාව, රුපියල් 5,000/- දීමනාව, රුපියල් 3,000/- අන්තර්කාලීන දීමනාව ප්‍රතිශෝධිත විශ්‍රාම වැටුප සමඟ ද ඒ ආකාරයටම ගෙවීම සිදු කළ යුතු ය.

05.16.2. ත්‍රිවිධ සන්නද්ධ හමුදා සේවාවන්හි විශ්‍රාමික නිලධරයන්ට අදාළව විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනය කිරීම

i. සන්නද්ධ හමුදා සේවාවන්හි විශ්‍රාමික නිලධරයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය සඳහාද විශ්‍රාම වැටුප් කළමනාකරණ දත්ත පද්ධතිය මගින් හඳුන්වා දෙන "2025 විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධන මොඩියුලය" (Pension Revision Module -2025) භාවිත කළ යුතු ය.

ii. සන්නද්ධ හමුදා සේවාවන්හි විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනයේ දී සේවය ලෙස අදාළ නිලධරයා අයත් හමුදා සේවය තෝරාගත යුතු ය.

(අ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - Sri Lanka Army
(ආ) ශ්‍රී ලංකා නාවික හමුදාව - Sri Lanka Navy
(ඇ) ශ්‍රී ලංකා ගුවන් හමුදාව - Sri Lanka Air Force

iii. නිලධරයා විශ්‍රාම ලැබූ අවස්ථාවේ දී දැරූ තනතුර ලෙස නිලධරයාගේ නිලය (Rank) ඇතුළත් කළ යුතු ය. නිලධරයාගේ තනතුර (නිලය) සහ විශ්‍රාම වැටුප ගණනය කිරීමට පාදක කර ගත් වැටුප් කේතය සහ අදාළ පරිවර්තන වගුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/2025 හි ඇමුණුම 03 හි ඇතුළත් තනතුරු උපලේඛනය සහ වැටුප් පරිවර්තන වගුවෙන් තෝරා ගත යුතු ය.

iv. මෙම පරිවර්තනයේ දී සංශෝධනය වන්නේ වැටුප පමණක් බැවින් මේ වන විට ගෙවමින් පවතින විශ්‍රාම වැටුප් ප්‍රතිශතයම මෙයට අදාළ කර ගත යුතු ය. (මේ සඳහා ඇමුණුම 02 හි ඇතුළත් ප්‍රතිශත වගුව භාවිත කළ යුතු ය.)

v. විශ්‍රාම වැටුප ගණනය කිරීම සඳහා පාදක කර ගත් වැටුප් පියවර පදනම් කරගෙන පරිවර්තන වගුවේ 2018.01.01 දිනට සඳහන් කර ඇති අනුරූපී වැටුප් පියවර කුමක් ද යන්න තහවුරු කර ගත යුතු ය.

vi. ඉහත 05.5 ඡේදය යටතේ සඳහන් කර ඇති තොරතුරු සමග 2018.01.01 දිනට අනුරූපී වැටුප් පියවර සහ ඊට අදාළ විශ්‍රාම වැටුප් ප්‍රතිශතය, ඊට අදාළ අඩු කළ සහ අඩු නොකළ වැටුප, 2025.07.01 දිනට ගෙවීම් කළ යුතු වැටුප යන තොරතුරු නිවැරදි ද යන්න පරීක්ෂා කිරීම සිදු කළ යුතු ය.

vii. ඉහත 05.16.2 (vi) අනුව දත්ත පද්ධතිය මගින් නිරූපනය කරන තොරතුරු විශ්‍රාම වැටුප් ලිපිගොනුවල ඇතුළත් තොරතුරු සමඟ සංසන්දනය කර නිරවද්‍යතාවය තහවුරු කිරීම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සේවයේ නියුතු විශ්‍රාම වැටුප් නිලධරයින් විසින් සිදු කළ යුතු අතර විශ්‍රාම වැටුප් නිලධරයින් නොමැති කාර්යාල වල එම කටයුත්ත සම්බන්ධයෙන් වගකීම පැවරෙන නිලධරයන් විසින් එය සිදු කළ යුතු ය. ඉහත පරිදි දත්ත පරීක්ෂා

කර තහවුරු කිරීමෙන් පසුව එම දත්ත නිර්දේශ කිරීම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරි විසින් ද අනුමත කිරීම අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් ද සිදු කළ යුතු ය. ඉන්පසුව පද්ධතිය මගින් ජනනය වන source document හි සකස් කිරීම, පරීක්ෂා කිරීම, නිර්දේශය සහ අනුමැතිය සම්බන්ධයෙන් අදාළ නිලධරයින්ගේ අත්සන් යොදා විශ්‍රාම වැටුප් ගොනුවට ඇතුළත් කිරීම සිදු කළ යුතු ය.

viii. ඉහත තොරතුරු අනුව විශ්‍රාමික නිලධරයාගේ සේවා කාලයට නියමිත ප්‍රතිශතය මත ප්‍රතිශෝධිත විශ්‍රාම වැටුප ගණනය කිරීම දත්ත පද්ධතිය මගින් සිදු කරනු ලැබේ. ඉහත පරිදි ගණනය කරන අඩු කළ / අඩු නොකළ විශ්‍රාම වැටුප ප්‍රතිශෝධිත විශ්‍රාම වැටුප වන අතර ඊට අදාළව විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය සංශෝධනය නොවේ.

ix. සන්නද්ධ හමුදා සේවාවන්හි මියගිය විශ්‍රාමික නිලධරයන් වෙනුවෙන් වැන්දඹු, වැන්දඹු පුරුෂ, අනත්දරු හා ආබාධිත විශ්‍රාම වැටුප් ලබමින් සිටින ප්‍රතිලාභීන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය කිරීමේ දී විශ්‍රාමික නිලධරයාට අදාළව දත්ත පද්ධතිය මගින් නිරූපනය කරනු ලබන තොරතුරුවල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමෙන් පසුව ඉහත 05.16.2 යටතේ සඳහන් කර ඇති පරිදි ප්‍රතිශෝධිත විශ්‍රාම වැටුප සකස් කිරීමට අදාළ කටයුතු සිදු කළ යුතු ය.

x. විශ්‍රාම වැටුප සමඟ මේ දක්වා ගෙවීම් කර ඇති ජීවන වියදම් දීමනාව, රුපියල් 5,000/- දීමනාව, රුපියල් 3,000/- අන්තර්කාලීන දීමනාව ප්‍රතිශෝධිත විශ්‍රාම වැටුප සමඟ ද ඒ ආකාරයටම ගෙවීම සිදු කළ යුතු ය.

05.17. මෙම විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය සිදු කිරීමේ දී විශ්‍රාමික නිලධරයන් ලබා ගත් පාරිතෝෂිකය වෙනුවෙන් මාසිකව සිදු කළ යුතු අඩු කිරීමෙහි වෙනසක් සිදු නොවිය යුතු ය.

05.18. පහතින් සඳහන් කරනු ලබන විශ්‍රාමිකයින්ට අදාළ විශ්‍රාම වැටුප් ලිපිගොනු විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය සිදු කිරීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ විෂමතා අංශය වෙත ඉදිරිපත් කිරීම සිදු කිරීම සිදු කළ යුතු ය.

i. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2 සහ 12 වගන්ති යටතේ විශ්‍රාම ගන්වා ඇති විශ්‍රාමිකයින්

ii. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2 සහ 15 වගන්ති යටතේ විශ්‍රාම ගන්වා ඇති විශ්‍රාමිකයින්

iii. “ට” උපලේඛනගත තනතුරු වල සේවයේ යෙදී විශ්‍රාම වැටුප් ලබමින් සිටින විශ්‍රාමිකයින්

iv. නැවත විවාහ වූ වැන්දඹු / වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් ලාභීන් සහ හිමි වැටුපෙන් ප්‍රතිශතයක් ලෙස විශ්‍රාම වැටුප් හිමිගන්වා ඇති වැන්දඹු, වැන්දඹු පුරුෂ, අනත්දරු, ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රතිලාභීන්

v. විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය සඳහා දත්ත පද්ධතිය වෙත තොරතුරු ඇතුළත් කළ නොහැකි ගැටලු පවතින සියලුම විශ්‍රාම වැටුප් ලිපිගොනු

05.19. මෙම චක්‍රලේඛ විධිවිධාන අනුව ගණනය කරන ප්‍රතිශෝධිත මාසික විශ්‍රාම වැටුප, දැනට ගෙවමින් පවතින මූලික විශ්‍රාම වැටුප සහ රුපියල් 3,500/- අන්තර් දීමනාව (හෝ ඉන් කොටසක්) යන දෙකෙහි එකතුව ඉක්මවා යන්නේ නම් එවැනි විශ්‍රාමිකයින් වෙත රුපියල් 3,500/-ක අන්තර් දීමනාව (හෝ ඉන් කොටසක්) තවදුරටත් ගෙවනු නොලැබේ.

05.20. මෙම චක්‍රලේඛ විධිවිධාන අනුව ගණනය කිරීමේ දී ප්‍රතිශෝධිත මාසික විශ්‍රාම වැටුප දැනට ගෙවන විශ්‍රාම වැටුපට වඩා අඩුවන විට දැනට ගෙවන විශ්‍රාම වැටුප එලෙසම ගෙවිය යුතු ය.

05.21. විදේශගත විශ්‍රාමිකයින්ට අදාළව මෙම චක්‍රලේඛය යටතේ සිදු කළ යුතු විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ විදේශ විශ්‍රාම වැටුප් අංශය විසින් සිදු කරනු ලැබේ.

05.22. 2025 වර්ෂය සඳහා ජීවිත සහතික යාවත්කාලීන කර ඇති විශ්‍රාමික නිලධරයින් වෙත පමණක් 2025.07.01 දින සිට සිදු කිරීමට නියමිත විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය යටතේ ප්‍රතිශෝධිත විශ්‍රාම වැටුප් හිමිගැන්වීම සිදු කෙරේ.

05.23. විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය සඳහා "2025 විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධන මොඩියුලය" (Pension Revision Module - 2025) භාවිත කළ යුතු ආකාරය පිළිබඳ පරිශීලක අත්පොත (User Manual) කඩිනමින් නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ.

06. මෙම චක්‍රලේඛයේ උපදෙස් වැරදි ලෙස නිර්වචනය කිරීම හේතුවෙන් හෝ ලියවිලිවල වැරදීමක් හේතුවෙන් හෝ ගණනය කිරීමේ දී ඇතිවන වැරදීමක් හේතුවෙන් හෝ වෙනත් වැරදීමක් හේතුවෙන් හෝ කිසියම් විශ්‍රාමික නිලධරයකුට වැඩිපුර මුදලක් ගෙවා ඇත්නම්, එවැනි වැඩිපුර ගෙවා ඇති මුදල් ආපසු ගෙවීමට එම විශ්‍රාමික නිලධරයා බැඳී සිටී.

07. මෙම චක්‍රලේඛය අනුව කටයුතු කිරීමේ දී එහි විධිවිධාන සම්බන්ධයෙන් පැහැදිලි කර ගැනීම් හෝ වැඩිදුර උපදෙස් අවශ්‍යවන අවස්ථාවල දී සහ පැනනගින තාක්ෂණික ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා පහත සඳහන් දුරකතන අංක වෙත සම්බන්ධ විය හැකි ය.

| අනු අංකය | තනතුර | දුරකථන අංකය |
|---|---|---|
| 01. | අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති හා විමර්ශන) | 011 2 421 786 |
| 02. | අධ්‍යක්ෂ (විශ්‍රාම වැටුප්) | 011 2 320 045 |

| | | |
|---|---|---|
| 03. | අධ්‍යක්ෂ ( ඩිජිටල් පරිපාලන සහ සේවා) | 011 2 431 729 |
| 04. | අධ්‍යක්ෂ (වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප්) | 011 2 336 913 |
| 05. | ගණකාධිකාරී (මාසික ගෙවීම්) | 011 2 331 791 |
| 06. | ගණකාධිකාරී (විෂමතා) | 011 2 441 730 |
| 07. | සහකාර අධ්‍යක්ෂ (විදේශ විශ්‍රාම වැටුප්) සහ (සන්නද්ධ සේවා-වැ.බ.) | 011 2 327 752 |


Azhami

**චාමින්ද හෙට්ටිආරච්චි**

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

දුරකතනය : 011 2 421786

ෆැක්ස් : 011 2 431413

විද්‍යුත් ලිපිනය : pen7policydep@gmail.com


**පිටපත් :**

1) ජනාධිපති ලේකම් - කරු. දැ.ගැ.ස.
2) අග්‍රාමාත්‍ය ලේකම් - කරු. දැ.ගැ.ස.
3) අමාත්‍ය මණ්ඩලයේ ලේකම්, අමාත්‍ය මණ්ඩල කාර්යාලය - කරු. දැ.ගැ.ස.
4) ලේකම්, මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.
5) ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.
6) ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.
7) ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව - කරු. දැ.ගැ.ස.
8) ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභාව - කරු. දැ.ගැ.ස.
9) ත්‍රිවිධ හමුදාධිපතිවරුන් - කරු. දැ.ගැ.ස.
10) විගණකාධිපති - කරු. දැ.ගැ.ස.

ඇමුණුම 01

## 2018.01.02 දින සිට විශ්‍රාම ලබන විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් ගණනය කිරීමේ ප්‍රතිශත චක්‍රය*

| සේවා කාලය | අවු.25 | | අවු.25 මාස 06 | | අවු.26 | | අවු.26 මාස 06 | | අවු.27 | | අවු.27 මාස 06 | | අවු.28 | | අවු.28 මාස 06 | | අවු.29 | | අවු.29 මාස 06 | | අවු.30 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| විශ්‍රාම ලබාගන්නා අවස්ථාවේදී ලැබූ වාර්ෂික වැටුප රුපියල් | අඩු නොකළ | අඩු කළ | අඩු නොකළ | අඩු කළ | අඩු නොකළ | අඩු කළ | අඩු නොකළ | අඩු කළ | අඩු නොකළ | අඩු කළ | අඩු නොකළ | අඩු කළ | අඩු නොකළ | අඩු කළ | අඩු නොකළ | අඩු කළ | අඩු නොකළ | අඩු කළ | අඩු නොකළ | අඩු කළ | අඩු නොකළ | අඩු කළ |
| 267504 ට අඩු | 85 | 75 | 86 | 76 | 87 | 77 | 88 | 78 | 89 | 79 | 90 | 80 | 90 | 81 | 90 | 82 | 90 | 83 | 90 | 84 | 90 | 85 |
| 267504-272664 | 84 | 74 | 85 | 75 | 86 | 76 | 87 | 77 | 88 | 78 | 89 | 79 | 90 | 80 | 90 | 81 | 90 | 82 | 90 | 83 | 90 | 84 |
| 272665-281232 | 83 | 73 | 84 | 74 | 85 | 75 | 86 | 76 | 87 | 77 | 88 | 78 | 89 | 79 | 90 | 80 | 90 | 81 | 90 | 82 | 90 | 83 |
| 281233-290280 | 82 | 72 | 83 | 73 | 84 | 74 | 85 | 75 | 86 | 76 | 87 | 77 | 88 | 78 | 89 | 79 | 90 | 80 | 90 | 81 | 90 | 82 |
| 290281-298368 | 81 | 71 | 82 | 72 | 83 | 73 | 84 | 74 | 85 | 75 | 86 | 76 | 87 | 77 | 88 | 78 | 89 | 79 | 90 | 80 | 90 | 81 |
| 298369-349140 | 80 | 70 | 81 | 71 | 82 | 72 | 83 | 73 | 84 | 74 | 85 | 75 | 86 | 76 | 87 | 77 | 88 | 78 | 89 | 79 | 90 | 80 |
| 349141-460212 | 79 | 69 | 80 | 70 | 81 | 71 | 82 | 72 | 83 | 73 | 84 | 74 | 85 | 75 | 86 | 76 | 87 | 77 | 88 | 78 | 89 | 79 |
| 460213-592704 | 78 | 68 | 79 | 69 | 80 | 70 | 81 | 71 | 82 | 72 | 83 | 73 | 84 | 74 | 85 | 75 | 86 | 76 | 87 | 77 | 88 | 78 |
| 592705-630828 | 77 | 67 | 78 | 68 | 79 | 69 | 80 | 70 | 81 | 71 | 82 | 72 | 83 | 73 | 84 | 74 | 85 | 75 | 86 | 76 | 87 | 77 |
| 630829-745548 | 76 | 66 | 77 | 67 | 78 | 68 | 79 | 69 | 80 | 70 | 81 | 71 | 82 | 72 | 83 | 73 | 84 | 74 | 85 | 75 | 86 | 76 |
| 745548 ට වැඩි | 75 | 65 | 76 | 66 | 77 | 67 | 78 | 68 | 79 | 69 | 80 | 70 | 81 | 71 | 82 | 72 | 83 | 73 | 84 | 74 | 85 | 75 |

ඇමුණුම 02

<u>ත්‍රිවිධ සන්නද්ධ හමුදා සේවාවන් හි විශ්‍රාම වැටුප් සහ විශ්‍රාම වැටුප් පාරිතෝෂික ගණන් බැලීමේ ප්‍රතිශත වක්‍රය</u>

| විශ්‍රාම වැටුප් ප්‍රතිශත වගුව (සේවා කාලය අනුව හිමි සියයට ප්‍රමාණය) | | | | |
|---|---|---|---|---|
| | නිලධාරි | | | |
| | 2009.05.19 ට පෙර | | 2009.05.19 ට පසු | |
| | පැරණි ප්‍රතිශතය | | නව ප්‍රතිශතය | |
| අවුරුදු | අඩු නොකළ | අඩු කළ | අඩු නොකළ | අඩු කළ |
| 10 | 55 | 45 | | |
| 11 | 56 | 46 | | |
| 12 | 57 | 47 | | |
| 13 | 58 | 48 | | |
| 14 | 59 | 49 | | |
| 15 | 60 | 50 | 75 | 65 |
| 16 | 61 | 51 | 76 | 66 |
| 17 | 62 | 52 | 77 | 67 |
| 18 | 63 | 53 | 78 | 68 |
| 19 | 64 | 54 | 79 | 69 |
| 20 | 65 | 55 | 80 | 70 |
| 21 | 66 | 56 | 81 | 71 |
| 22 | 67 | 57 | 85 | 75 |
| 23 | 68 | 58 | 85 | 75 |
| 24 | 69 | 59 | 85 | 75 |
| 25 | 70 | 60 | 85 | 75 |
| 26 | 71 | 61 | 85 | 75 |
| 27 | 72 | 62 | 85 | 75 |
| 28 | 73 | 63 | 85 | 75 |
| 29 | 74 | 64 | 85 | 75 |
| 30 | 75 | 65 | 85 | 75 |
| 31 | 77 | 67 | 85 | 75 |
| 32 | 79 | 69 | 85 | 75 |
| 33 | 81 | 71 | 85 | 75 |
| 34 | 83 | 73 | 85 | 75 |
| 35 | 85 | 75 | 85 | 75 |

| විශ්‍රාම වැටුප් ප්‍රතිශත වගුව (සේවා කාලය අනුව හිමි සියයට ප්‍රමාණය) | | | | |
|---|---|---|---|---|
| | සෙසු නිල | | | |
| | 2009.05.19 ට පෙර | | 2009.05.19 ට පසු | |
| | පැරණි ප්‍රතිශතය | | නව ප්‍රතිශතය | |
| අවුරුදු | අඩු නොකළ | අඩු කළ | අඩු නොකළ | අඩු කළ |
| 10 | | | | |
| 11 | | | | |
| 12 | 60 | 50 | | |
| 13 | 61 | 51 | | |
| 14 | 62 | 52 | | |
| 15 | 63 | 53 | 78 | 68 |
| 16 | 64 | 54 | 79 | 69 |
| 17 | 65 | 55 | 80 | 70 |
| 18 | 66 | 56 | 81 | 71 |
| 19 | 67 | 57 | 82 | 72 |
| 20 | 68 | 58 | 83 | 73 |
| 21 | 69 | 59 | 84 | 74 |
| 22 | 70 | 60 | 85 | 75 |
| 23 | 71 | 61 | 85 | 75 |
| 24 | 72 | 62 | 85 | 75 |
| 25 | 73 | 63 | 85 | 75 |
| 26 | 74 | 64 | 85 | 75 |
| 27 | 75 | 65 | 85 | 75 |
| 28 | 76 | 66 | 85 | 75 |
| 29 | 77 | 67 | 85 | 75 |
| 30 | 78 | 68 | 85 | 75 |
| 31 | 80 | 70 | 85 | 75 |
| 32 | 82 | 72 | 85 | 75 |
| 33 | 84 | 74 | 85 | 75 |
| 34 | 86 | 76 | 85 | 75 |
| 35 | 88 | 78 | 85 | 75 |

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක:- 13/2001

මගේ අංකය : පී.එස්/4042 ඒ
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත මහ ලේකම් කාර්යාලය,
මාලිගාවත්ත,
කොළඹ 10.
2001.12.20

දිස්ත්‍රික් ලේකම්වරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්.

**විශ්‍රාම වැටුප් ලිපිගොනුවක් අස්ථානගත වූ විට ගෙවීම් කටයුතු සඳහා තාවකාලික ගොනුවක් පිළියෙල කර ගැනීම**

විශ්‍රාම වැටුප් ගෙවීමකදී, මාරු කිරීමකදී හෝ වෙනයම් කාරණයකදී, අදාල විශ්‍රාම වැටුප් ලිපි ගොනුව ඔබ කාර්යාලයේ අස්ථානගත වී ඇති අවස්ථාවක පහත සඳහන් ක්‍රියා මාර්ගය අනුගමනය කරන්න.

අදාල විශ්‍රාම වැටුප ඔබ කාර්යාලය මගින් ගෙවීම කිරීම සඳහා මාරු කර ඇති විශ්‍රාම වැටුපක් නම් පෙර ගෙවීම් කරන ලද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් හෝ කාර්යාල වලින් ප්‍රථමයෙන් විමසීම් කරන්න. විශ්‍රාම ප්‍රදානය තීරණය කරන ලද හා පළමු ගෙවීම කරන ලද කාර්යාල වලින් ද මෙම දෙපාර්තමේන්තුවෙන් ප්‍රදානය තීරණය කර ඇත්නම් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අංශය භාර සහකාර අධ්‍යක්ෂ වෙතින් ද ගොනුව සම්බන්ධව විමසීම් කරන්න.

ඉහත විමසීම් වලින් විශ්‍රාම වැටුප් ලිපිගොනුව සොයාගත නොහැකි නම් පහත සඳහන් විස්තර ලබාගෙන පිටපත් ගොනුවක් පිළියෙල කර ගැනීමට කටයුතු කරන්න.

**තාවකාලික ගොනුවට අවශ්‍ය ලිපි**

1. ජාතික හැඳුනුම්පතෙහි සහතික පිටපතක්
2. විශ්‍රාම වැටුප් හැඳුනුම්පතෙහි සහතික පිටපතක්
3. විශ්‍රාම ප්‍රදානයෙහි පිටපතක්
4. විශ්‍රාම වැටුප් ලියාපදිංචි කිරීමේ ලේඛනයේ වාර්තාවක් (ප්‍රදානය තීරණය කරන ලද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව / දිස්ත්‍රික් ලේකම් / ප්‍රාදේශීය ලේකම් / අදාල දෙපාර්තමේන්තුව වෙතින් ලබාගත යුතුය.)
5. පදිංචි ග්‍රාමයට අයත් ග්‍රාමසේවක විසින් නිර්දේශ කර ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරන ලද, අත්සන් සහතිකයක් හා ඡායාරූප පිටපතක්.
6. හැකිනම් අන්තිම වරට සේවය කරන ලද දෙපාර්තමේන්තුවෙන් පෞද්ගලික ගොනුවේ ඇති පොදු 55 ආකෘතියේ හා වැටුප් සටහන් වල පිටපත්
7. පහත විස්තර සඳහන් දිවුරුම් ප්‍රකාශයක් විශ්‍රාමිකයාගෙන් ලබා ගන්න.
   (i) විශ්‍රාම වැටුප් අංකය
   (ii) විශ්‍රාම ගිය දිනය
   (iii) අවසන් වරට සේවය කරන ලද දෙපාර්තමේන්තුව
   (iv) අවසන් වරට විශ්‍රාම වැටුප් ලබාගත් අවුරුද්ද / මාසය / මුදල

(v) අවසන් වරට විශ්‍රාම වැටුප් ලබාගත් බැංකුවේ නම / තැපැල් කාර්යාලය / ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

(vi) මෙම විශ්‍රාම වැටුප් වෙනත් කාර්යාලයකින් ලබා ගන්නේ නම්

එස්.ඩබ්. ජයසිංහ,
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ.

පිටපත් :

1. ලේකම් - රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු, පළාත් පාලන, පළාත් සභා, සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය.
2. අයවැය අධ්‍යක්ෂ ජනරාල්
3. ගිණුම් හා ගෙවීම් අධ්‍යක්ෂ ජනරාල්
4. විගණකාධිපති.

# විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනයට අදාළ වන විශ්‍රාම වැටුප් වර්ග සංකේත අංක

| | |
|---|---|
| 1 | සිවිල් විශ්‍රාම වැටුප් |
| 2 | ගුරු (පෞද්ගලික පාසල්, පිරිවෙන්) |
| 3 | සන්නද්ධ සේවා විශ්‍රාම වැටුප් |
| 13 | පළාත් පාලන වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් |
| 14 | පළාත් පාලන වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් |
| 15 | පළාත් පරිපාලන සේවා විශ්‍රාම වැටුප් |
| 21 | වැන්දඹු විශ්‍රාම වැටුප් |
| 22 | වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් |
| 23 | වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් |
| 24 | වැන්දඹු ආබාධිත විශ්‍රාම වැටුප් |
| 25 | වැන්දඹු භාරකරු විශ්‍රාම වැටුප් |
| 27 | වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් |
| 28 | වැන්දඹු පුරුෂ ආබාධිත විශ්‍රාම වැටුප් |
| 31 | ගුරු වැන්දඹු විශ්‍රාම වැටුප් |
| 32 | ගුරු අනත්දරු විශ්‍රාම වැටුප් |
| 33 | ගුරු ආබාධිත විශ්‍රාම වැටුප් |
| 40 | සන්නද්ධ සේවා වැන්දඹු විශ්‍රාම වැටුප් |
| 41 | සන්නද්ධ සේවා අනත්දරු විශ්‍රාම වැටුප් |
| 43 | සන්නද්ධ සේවා භාරකරු විශ්‍රාම වැටුප් |
| 44 | සන්නද්ධ සේවා වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් |
| 45 | සන්නද්ධ සේවා වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් |
| 60 | නැවත විවාහ හමුදා වැන්දඹු |
| 61 | නැවත විවාහ සිවිල් වැන්දඹු |
| 62 | නැවත විවාහ සිවිල් වැන්දඹු පුරුෂ |
| 63 | නැවත විවාහ හමුදා වැන්දඹු පුරුෂ |
| 68 | අවු.55 සම්පූර්ණ වූ අවු.10ට අඩු සේවා විශ්‍රාම වැටුප් - පොලිස් |
| 69 | අවු.55 සම්පූර්ණ වූ අවු.10ට අඩු සේවා විශ්‍රාම වැටුප් - ත්‍රිවිධ හමුදා |

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක : 7/2000

මගේ අංකය: පී.එච්.4042 ඒ.

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත,
කොළඹ 10.

2000.09.07

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්,
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

අවම සේවා කාලය අවු.25 ට අඩු වූ විට
වැන්දඹු අනත්දරු / වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප ගෙවීම

යම් අයෙකුගේ සේවා කාලය අවු: 25 ට අඩුවන අවස්ථාවලදී වැන්දඹු අනත්දරු/ වැන්දඹු පුරුෂ අනත්දරු පනත්වල විධිවිධාන වලට අනුව ගෙවිය යුතු වැන්දඹු අනත්දරු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප තීරණය කිරීමට අවකාශ ඇත. එහෙත් ඇතැම් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් සේවා කාලය වසර 25 ට අඩු නිලධාරීන් වෙනුවෙන් ගෙවනු ලබන වැන්දඹු අනත්දරු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ගණනය කිරීමේදී එකී විධිවිධාන අනුව කටයුතු නොකරන බවක් දැන ගන්නට ලැබී ඇත.

02. එහෙයින් 1990.09.01 සිට 90.10.17 කාලය තුළ සහ 1996.12.24 දිනට පසු විශ්‍රාම ගිය හෝ සේවයේ යෙදී සිටියදී මියගිය සාමාජික/ සාමාජිකාවන් වෙනුවෙන් වැන්දඹු අනත්දරු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ගණනය කිරීමේදී මේ සමග අමුණා ඇති දැනට සේවා කාලය වසර 25 ට අඩු නිලධාරීන් සම්බන්ධව වැන්දඹු අනත්දරු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ගණනය කිරීම් [illegible] උපායයට අනුව ගණනය කිරීම කර ගෙවීම කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

(පී.එම්.පී. ජයවර්ධන)
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ.

පිටපත :

1. ලේකම් - රා.පරි.ස්ව.ක. අමාත්‍යාංශය
2. විගණකාධිපති
3. අය වැය අධ්‍යක්ෂ ජනරාල්.

I

<u>වැ.අ.වි. වැටුප් අත්පොතෙහි උධෘතයකි</u>

9:2:14 1990.09.01 සිට 1990.10.17 කාලය තුළ සහ 1996.12.24 දිනට පසු විශ්‍රාම ගිය හෝ සේවයේ සිටියදී මියගිය සාමාජික/සාමාජිකාවන් වෙනුවෙන් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගණනය කිරීමේ විශේෂ නියමයන්.

9:2:14:1 මෙම කාලයන් තුළ අවු සේවා කාලයක් සහිතව මියගිය හෝ විශ්‍රාම ගිය සාමාජිකයින් වෙනුවෙන් අවු. 25 සේවා කාලයක උපරිමයකට යටත්ව වැඩි විශ්‍රාම වැටුපක් ගෙවීමට වැ.අ./වැ.පු. පනත්වල විධිවිධාන සලසා ඇත. 1981 අංක 44 පණතේ 20 - (2) (අ) (1) වගන්ති

9:2:14:2 ඒ අනුව විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවේ 2 වගන්තිය අනුව සේවා කාලය 25 අවුරුද්දක විශ්‍රාම වැටුප් හිමි සේවා කාලයක් සඳහා හෝ මිය නොගියේ නම් හෝ විශ්‍රාම නොගත්තේ නම් අනිවාර්ය විශ්‍රාම යාමේ වයස එළඹීමේ දී ඔහු විසින් සම්පූර්ණ කළ හැකි වූ විශ්‍රාම වැටුප් හිමි සේවා කාලයක් සඳහා හෝ යන දෙකින් වඩා කෙටි කාලය සඳහා ගෙවිය යුතු විශ්‍රාම වැටුපට සමාන මුදල් ප්‍රමාණයක් ගෙවිය හැකිය.

<u>උදාහරණ</u> : (1) වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා ඇරණියගල ප්‍රාදේශීය ලේකම් වෙත යවා ආපසු එවා ඇති අංක: 82/806800 දරණ ලිපිගොනුව අනුව විස්තර මෙසේය.

| | |
|---|---|
| නම | : බී.පී.විමලසුරේන්ද්‍ර |
| උපන් දිනය | : 1952.08.06 |
| මුල් පත්වීම් දිනය | : 1993.01.18 |
| සේවයේ සිටියදී මියගිය දිනය | : 1997.12.27 |
| සේවා කාලය | : අවු: 04 මාස 11 |
| අවසන් වැටුප | : රු.70140/= |

<u>විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය හැකි විශ්‍රාම වැටුප ගණනය කිරීම :</u>

අවු:25 සේවා කාලයට වැටුපට අදාළ ප්‍රතිශතය 80%

සේවා කාලය අවු:25 ට අඩු නිසා අඩු කළයුතු ප්‍රතිශතය : _25-4,1/2)x2=41

විශ්‍රාම වැටුප ගණනය කළහැකි ප්‍රතිශතය = 80 - 41 =39

විශ්‍රාම වැටුප $= \frac{70140 \times 39}{100} = 27354.60$

මොහු අවු: 60 දක්වා සේවය කළේ නම් සේවා කාලය අවු:18 මාස 06 කි. එම කාලය අවුරුදු 25 නොඉක්මවන බැවින් එම සම්පූර්ණ කාලය විශ්‍රාම වැටුප් ගණනය සඳහා යොදා ගත හැක.

## වැන්දඹු අනාථදරු විශ්‍රාම වැටුප් ගණනය කිරීම

අවු: 25 සේවා කාලයට වැටුපට අදාළ ප්‍රතිශතය = 80%

අඩු කළයුතු ප්‍රමාණය (25-18, 1/2)x2 = 13

ශුද්ධ ප්‍රතිශතය = 67%

වාර්ෂික වැ.අ.වි.වැටුප = $\frac{70140 \times 67}{100}$ = 46993.80

ගෙවිය හැකි වැ.අ.වි.වැටුප = රු: 46993.80

### උදාහරණ II (කල්පිත)

| | |
|---|---|
| උපන් දිනය | 1975.01.01 |
| මුල් පත්වීම් දිනය | 1997.01.01 |
| මියගිය දිනය | 1998.01.01 |
| සේවා කාලය | අවු: 01 |
| අවසාන වැටුප | රු: 84000/= |

### විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය අනුව ගණනය කිරීම

අවු: 25 සේවා කාලයට අදාළ ප්‍රතිශතය : 79%

අඩු කිරීම : (25 - 1) x 2 = 48

හිමි ප්‍රතිශතය : 79 - 48 = 31

විශ්‍රාම වැටුප : $\frac{84000 \times 31}{100}$

: රු: 26040/=

### වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් පනත අනුව ගෙවිය හැකි විශ්‍රාම වැටුප් ගණනය කිරීම

වයස අවු: 60 පිරෙන දිනය : 1975 + 60 = 2035

එදින තෙක් ජීවත් වී නම් සේවා කාලය : අවු: 38

එම නිසා වැ.අ.වි.වැ. සඳහා ගණන් ගත හැකි කාලය : අවු: 25

වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප : $\frac{84000 \times 79}{100}$

: රු: 66360/=

රු: 66360/= වැ.අ.වි.වැ. ලෙස ගෙවිය හැක.

### උදාහරණ: (III)

ඉහත II උදාහරණයේ පස උපන් දිනය 1940 ලෙසත්, පත්වීම් දිනය 1967 ලෙසත් සැලකුවහොත් විශ්‍රාම වැටුප ගණනය කිරීම

සේවා කාලය අවු: 31

අවු: 30 ට අදාළ ප්‍රතිශතය 90%

III

<u>සිවිල් විශ්‍රාම වැටුප ගණනය කිරීම</u> = $\frac{84000 \times 90}{100}$

සිවිල් විශ්‍රාම වැටුප = රු:75600/=

මෙම මුදල ඉහත II උදාහරණයේ වැ.අ.වි.වැ. ලෙස ගණනය කළ මුදල ද ඉක්මවා ඇති බැවින් වැ.අ.වි.වැ. ලෙස රු:75600/= ගෙවිය හැක.

(4) වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් පනත් අනුව හා ඉහත උදාහරණ අනුව ගෙවිය හැකි වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප පහත සඳහන් අවස්ථා වලට අදාළ කරගත නොහැක.

I. ආයතන සංග්‍රහයේ දක්වා ඇති හේතු මත වහාම, අකාර්යක්ෂමතාව මත විශ්‍රාම ගැන්වීම, වෛද්‍ය හේතු මත විශ්‍රාම ගැන්වීම යන හේතු මත විශ්‍රාම ගැන්වූවන්,

II. අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස එළඹීමට පෙර විශ්‍රාම ගනු ලැබූ අය එනම්, වයස අවු:55 - 60 අතර විශ්‍රාම ගන්නවුන් (විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහ 2:17) ගුරුවරියන්, හෙදියන්, දුරකථන සේවිකාවන්, සේවා කාලය අවු:20 දී හෝ වයස අවු: 50 දී විශ්‍රාම යාම. (විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය 2:14)

මෙම අවස්ථා වලදී ගෙවිය හැක්කේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගණනය කළ විශ්‍රාම වැටුපකි.

(5) 1985.01.01 සිට 1990.08.31 දක්වා කාලය තුළ සිවිල් විශ්‍රාම වැටුප් ගණනය කරන ලද්දේ මියගිය හෝ විශ්‍රාම ගිය දිනට වයස සහ අවසන් වැටුප පදනම් කරගෙනය. සේවා කාලය පිළිබඳ සැලකිමක් නොමැතිව විශ්‍රාම වැටුප් ගණනය කළ හෙයින් මෙම කාලය තුළ මියගිය හෝ විශ්‍රාම ලැබූ නිලධාරීන් වෙනුවෙන් වැන්දඹු අනත්දරු පනත් වල සඳහන් ගණනය කිරීමේ ක්‍රම උපයෝගී කරගත නොහැක. අඩු නොකළ විශ්‍රාම වැටුප ලෙස ගණනය කළ විශ්‍රාම වැටුප වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප ලෙස ගෙවනු ලැබේ.

ඇමුණුම 06

## විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනයට අදාළ නොවන විශ්‍රාම වැටුප් වර්ග සංකේත අංක

| | |
|---|---|
| 4 | සන්නද්ධ සේවා යැපෙන්නන්ගේ දීමනා |
| 5 | තුවාල දීමනා |
| 6 | සන්නද්ධ සේවා දුබලතා විශ්‍රාම වැටුප් |
| 7 | පුණ්‍යාධාර දීමනා |
| 12 | වන්දි විශ්‍රාම වැටුප් |
| 42 | සන්නද්ධ සේවා ආබාධිත විශ්‍රාම වැටුප් |
| 56 | පොලිස් දුබලතා |
| 57 | පොලිස් යැපෙන්නන්ගේ දීමනා |
| 58 | සේවා කාලය වසර 10කට අඩු පොලිස් ආබාධිත විශ්‍රාම වැටුප් |
| 59 | සේවා කාලය වසර 10කට අඩු සන්නද්ධ සේවා ආබාධිත විශ්‍රාම වැටුප් |
| 75 | වෙනත් භාරකාර විශ්‍රාම වැටුප් |
| 77 | සන්නද්ධ සේවා දුබලතා විශ්‍රාම වැටුප් වන්දි වැටුප් නොලබන |